# මනුෂ්‍යත්වය හා ලිංගිකත්වය



**මානවයා වූ කලී විවිධ වූ ආශාවන්, බලාපොරොත්තු, හැඟීම් ආදියෙන් පිරිපුන් කොට්ඨාසයකි. එවැන්නකු තුළ ලිංගිකත්වය නැමති උත්තේජකය ප්‍රතිපෝෂණය වීම අරුමයක් නොවනු ඇත.**

**සෙ**ත් පිරිතෙන් අවදි වී මහ පිරිතෙන් නින්දට යන සමාජයක වර්තමාන පැතිකඩ අවසන ඉතිරි ප්‍රශ්නාර්ථයක් පමණ ද? විදුරු නුවණින් යුක්ත ව සියල්ල අබියස අඳ ගොළුවන් සේ බලා සිටීමට සිදු වීම කොතරම් ශෝචනීය ද? ලොවක ජීවය රඳා පවතින්නේ හිරුගේ රුස්වලින් හා මවගේ කිරෙනි. වත්මනට කොතරම් දුරට මෙය අර්ථ සම්පන්න ද? දස මසක් කුස හොවා රක්ත වර්ණ ලේ ශ්වේත වර්ණයට හරවා දරුවෙකු මෙලොවට ජනිත කරවීමට මවක් දරන වෑයමම අබියස මාතෘත්වයට නිගා කරන තිරිසනුන් ලොව රජයන මෙවන් වකවානුවක බිහි කළ හැකි ද සිත් පිත් ඇති මිනිසෙක්.... අසන්න වරක් නොව දෙවරක් මසැසින් නොව මනසින්. ජාති, ආගම්, කුල මත යැපෙන පාපතරයන් නිරුවත් කර ඇති සමාජය තුළ වැජඹීමට සිදු වීම ම පෙර කල පවක් ලෙස ඔබට හැඟෙනු නොඅනුමාන යි.

මානවයා වූ කලී විවිධ වූ ආශාවන්, බලාපොරොත්තු, හැඟීම් ආදියෙන් පිරිපුන් කොට්ඨාසයකි. එවැන්නකු තුළ ලිංගිකත්වය නැමති උත්තේජකය ප්‍රතිපෝෂණය වීම අරුමයක් නොවනු ඇත. එවැන්නක් නොතිබුණි නම්, මා මෙය ලියන්නටත්, ඔබ මෙය කියවන්නටත් වාසනාවන්ත නොවනු ඇත. සැබෑ යථාර්ථය මෙය වුවත් ලිංගිකත්වයට එහා ගිය රාගයෙන් වියරු වූ තිරිසනුන් මාන බලනුයේ අහිංසක මල් කැකුළු තලා පොඩි කර දැමීමට ය. මෙවන් සිත් පිත් නැත්තවුන් කෙලෙසා දමනුයේ තම මාතෘත්වය බැව් නැවතිල්ලේ සිතන විට පසක් වුව ද ඉන් ඔබ්බට ගිය කල එය මානසික විකෘතිතාවයක් ද යන්න පිළිබඳ කුකුසක් පවතී. එසේ වුවත් මෙවන් වූ මානසික අසහනකාරයින් අබියස තම ඉරණම හමාර කර ගන්නා බිළිඳියන්, තරුණියන්, කාන්තාවන් පිළිබඳ ඛේදවාචක දිනෙන් දින



කන වැකීමට තරම් කුරිරු සමාජයක් වත්මනේ බිහි වී ඇත. ගතානුගතිකත්වය, මමත්වය තකා හුදු තම ආශාවන් ඉටු කර ගැනීමට තරම් විනිර්මුක්ත දේශයේ සර්වභෞමිකයන් පත් ව ඇත්තේ කාගේ වරදින් ද? මනුෂ්‍යත්වය හා ලිංගිකත්වය වූ කලී අර්ථ සම්පන්න වූත්, ශිෂ්ට සම්පන්න වූත් සමාජයක මානව වර්ගයාගේ පැවැත්ම මත රඳා පවතින දෙයකි.

"ප්‍රේමය නම් රාගයෙන් තොර සඳ එළිය සේ අචින්ත්‍යයි, පූජනීයයි..."මෙහි පවතින සත්‍ය කුමක් ද? වර්තමාන ප්‍රේමය වූ කලී රාගය, ලිංගිකත්වය මත ම පදනම් වූවක් නොවේ ද? මෙම උතුම් යැයි පවසන ප්‍රේමය මුල් කොට ගෙන තම පෙම්වතිය මරා දැමීමට තරම් සැහැසි වූ පෙම්වතා ඇයගේ මාරයා වී හමාර ය. ආදරය හා වෛරය අතර වෙනස කෙස'ගක් තරම්වත් නොවන බව පඬියන් පැවසුවේ කට කසනවාට නොවේ. ප්‍රියයන්ගෙන් වෙන් වීම දුකකි. නමුත් සියල්ල ඉවසීමෙන් විඳ දරා ගැනීම මානනීයත්වයෙන් කිරුළු පැළඳීමකි. ආදරය, විවාහය, දික්කසාදය නවතම විලාසිතාවක් බවට පත් ව ඇත.බටහිර පන්නයට හැඩ ගැසෙන්නට දඟලන තරපණුවන් සියල්ල තේරුම් ගන්නා විට පෙරහැර ගොස් හමාර ය. දැන් ඉතින් කුමට බෙර වයන්න ද?

එකී මෙකී නොකී සියල්ල ගත් විට ලිංගිකත්වය සේල් දමන යුගයක පාපතරයන් බිහි වීම ද යම්තාක් දුරට අරුමයක් නොවනු ඇත. මෙකී වූ පිසාචයන් ප්‍රසිද්ධියේ ගල් ගසා මරා දැමුව ද පව් නැත. බලාපොරොත්තු දැල්වෙන දෑස් අබියස අකලංක ප්‍රාර්ථනාවන් පෙරදැරි ව වෙසෙන අහිංසකයින් අමු අමුවේ නිරුවත් කොට ජීවිත බිලි ගන්නා සිත් පිත් නැති වනචරයින් ආණ්ඩුවේ මුදලට කුමට නම් සිරබත් කෑමට යොමු කරත් ද? මෙලෙස ප්‍රකාශ කිරීම ලැජ්ජාවට කරුණක් නොවේ. සිතන්න යම් දිනෙක එය ඔබේ මවට, සහෝදරියට, පෙම්වතියට හෝ දියණියට විය හැකි ය. ඔවුන්ට මෙවන් ඉරණමක් අත් වූයේ නම්, ඔබ කෙසේ එය විඳ දරා ගන්න ද?

දැන් ඔබටත් යමක් සිතන්නට ඇත. නැවතිල්ලේ සිතන්න. සාධු ජනයා ජීවත් වනවා'යි උදම් ඇනූ ධර්මද්වීපයට මෙවන් ඉරණමක් අත් වූයේ මන් ද?

**ඩී. එම්. අයි .මධුෂාණි**